# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

EDB
EXPORT DEVELOPMENT BOARD
SRI LANKA

**වෙළඳ අමාත්‍යාංශය**

## සුළු සහ මධ්‍යම පරිමාණ අපනයනකරුවන් අලෙවිකරණය සහ සන්නාම සංවර්ධනය තුළින් අගයදාමයේ ඉහළට ගෙන යාමේ ධාරිතා වර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් සුළු සහ මධ්‍යම පරිමාණයේ අපනයනකරුවන්ගේ හැකියාවන් වර්ධනය කරමින් අලෙවිකරණය සහ සන්නාම සංවර්ධනය හරහා අගයදමයේ ඉහළට නැංවීම සඳහා ව්‍යුහාත්මක පුහුණු වැඩසටහනක් පැවැත්වීමට යෝජනා කරයි.

අපනයන ඉහළ නැංවීම සඳහා තරගකාරී වාතාවරණයක් තුළ ක්‍රියාත්මක වෙමින් නිර්මාණාත්මක, නව්‍ය අලෙවිකරණ සහ සන්නාමකරණ උපාය මාර්ගයන්ගෙන් ව්‍යාපාරයන් සන්නද්ධ කිරීමට අවශ්‍ය වන ව්‍යවසායකත්වයේ අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව අවබෝධයක් ලබා දීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ.

### සලකා බලනු ලබන කණ්ඩායම්

රු. මි. 16 ත් රු. මි. 750 ත් අතර සමස්ත වාර්ෂික විකුණුම් පිරිවැටුමක් ලබන සහ අවම වශයෙන් වසර 03 ක අපනයන පළපුරුද්දක්, ශක්තිමත් දේශීය සැපයුම් දමයක්, ප්‍රමාණවත් සම්පත් සහ යටිතල පහසුකම් පවතින සුළු සහ මධ්‍යම පරිමාණ භාණ්ඩ සහ සේවා අපනයනකරුවන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. කෙටි ලැයිස්තු ගත කළ අයදුම්පත් අතරින් සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසු සමාගම් තෝරා ගනු ලබයි.

### යෝජිත සභය

වෘත්තීමය අලෙවිකරණ උපදේශන ආයතනයක් විසින් පුහුණු වැඩසටහන පැවැත්වීමට යෝජිතය. විවිධ ව්‍යාපාර ආධාරක සේවාවන් තුළින් තෝරාගන්නා ලද ව්‍යවසායකයන්ගේ ධාරිතාවය ගොඩනැංවීම උදෙසා මෙම වැඩසටහන සැලසුම් කර ඇත.

වෙළඳ නාම උපදේශනය, ක්ෂේත්‍ර අධ්‍යනය සහ වෙළඳ සන්නාමයක් ගොඩනැගීම පිළිබඳ පුද්ගලික මග පෙන්වීම ඇතුළත් අන්තර් ක්‍රියාකාරී පන්ති කාමර ඉගෙනුම් සැසි සහ ප්‍රායෝගික සන්නාම පුහුණු සැසි යන අංශ දෙකකින් මෙම වැඩසටහන සමන්විත වේ.

මෙම වැඩසටහන මාස 06 ක කාලයක් සඳහා අදාළ වේ.

### අයදුම් කළ යුතු ආකාරය

අයදුම්පත ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය වන www.srilankabusiness.com වෙතින් බාගත කරගත හැක.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, අධ්‍යක්ෂ/ වෙළඳපළ සංවර්ධන, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, අංක 42, නවම් මාවත, කොළඹ 02 යන ලිපිනය වෙත 16/08/2021 වන සඳුද දිනට හෝ ඉන් පෙර ලැබෙන සේ යොමු කළ යුතු වේ.

වැඩි විස්තර සඳහා දිනුෂිකා අබේගුණවර්ධන මිය, සහකාර අධ්‍යක්ෂ/ වෙළඳපළ සංවර්ධන දු.ක. 0776190050, විද්‍යුත් තැපැල: dinushika@edb.gov.lk අමතන්න.

**සභාපති සහ ප්‍රධාන විධායක,**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**

**නො. 42, නවම් මාවත,**

**කොළඹ 02**

**දු.ක. – 011-2300705-11 ෆැක්ස් - 011-2300715**

**වෙබ්. www.srilankabusiness.com**